**ජයා කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ් - 2023**
**----------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ජයා කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ් සමාගමේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හා අලාභ ප්‍රකාශනය, විස්තීර්ණ වෙනත් ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 වර්ෂයේදී සමාගමේ භාවිතය සඳහා ලංකා ඔටෝ ඩීසල් ලීටර් 13,140,300 ක් හා දැවිතෙල් (Furnace Oil) ලීටර් 11,186,700 ක් මිලදී ගෙන තිබුණු අතර 2023 දෙසැම්බර් 31 දිනට භාවිතයට නොගත් ලංකා ඔටෝ ඩීසල් හා දැවිතෙල් පිළිවෙලින් ලීටර් 17355 ක් හා ලීටර් 4077 ක් ටැංකිය තුළ ඉතිරිව තිබුණි. මෙම ශේෂයන් වර්ෂ අවසානයේ තොග ගණනයේදි මඟහැරී ඇති බැවින් ඒවායේ එකතු වටිනාකම වූ රු.6,910,621ක ඔටෝ ඩීසල් රු.5,758,909ක් හා දැවිතෙල් රු.1,151,712 ක වටිනාකමින් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් අඩුවෙන් දක්වා තිබුණි. | මෙම ඉන්ධන ශ්‍රී ලංකා ඛනිජ තෙල් සංස්ථාව වෙතින් මිලදී ගෙන අප ආයතනයේ බොයිලේරුවලට සහ පොම්පවලට එදිනෙදා ක්‍රියාකරවුම් අවශ්‍යතා සඳහා යොදා ගැනීම සඳහා පවත්වාගෙන යයි. මෙම තොග දිගු කාලයක් නොපවතින අතර මිලදී ගන්නා තෙල් මාසයක් පමණ පවතින අතර එදිනෙදා ක්‍රියාකරවුම් අවශ්‍යතා සඳහා පොම්ප සහ බොයිලේරු වලට යොදා ගනී. මේවා මිලදී ගැනීමට ගිය වියදම අදාල ඛනිජ තෙල් ගිණුමෙහි පෙන්වා ඇත. අප ආයතනය ආරම්භයේ සිටම එනම් 2008 වර්ෂයේ සිටම මෙම තොග ජංගම වත්කම් ලෙස වාර්තා කොට දක්වා නොමැත. | ආයතනය විසින් කරනු ලබන වියදම් නිවැරදි වර්ගීකරණය අනුව ගිණුම්ගත කළ යුතු බව. |
| (ආ) | 2012 වර්ෂයේදි කරන ලද අඩු පොලී මත ණයවලට අදාළ පොලී හා පාරිතෝෂිත ගණනය ගිණුම්වලට ගැලපීමේදී පැන නැගී තිබූ රු.3,294,694 ක බැර ශේෂ 02ක් වාර්ෂිකව ඉදිරියට ගෙනවිත් තිබුණු අතර 2023 වර්ෂයේදී නිලධාරින්හට ගෙවන ලද වැටුප් ගිණුමින් ගැලපිම් කිරිම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ වැටුප් රු.3,294,694 කින් අඩුවෙන් දක්වා තිබුණි. | මෙම ගිණුමේ පැවතියේ 2012 වර්ෂයේ දී SLFRS නව ගිණුම් ක්‍රමය හඳුන්වා දීමත් සමගම අප ආයතනයේ එකළ ගිණුම් විගණනය සිදුකල PWC (Pvt) Ltd ආයතනය විසින් සේවකයන්ගේ අඩු පොළී ණය සහ පාරිතෝෂික ගණනය පිළිබඳ ගිණුම් වර්තා කිරීමට අදාල ගැලපීම් සිදු කරන ලද ශේෂයකි. මෙම ගිණුමේ ශේෂය දිගින් දිගටම පැවතීම පිළිබඳව ඔබ විසින් වාචිකව විමර්ශනය සිදු කල බැවින් සහ එම ගිණුම් ශේෂය අනාර්ථික ශේෂයක්ද වන බැවින් එය මෙම වසරේ දී වඩාත්ම ගැලපෙන ගිණුමක් හරහා ගැලපීම සිදු කරන ලදී. එම ශේෂය කුමන ගිණුමක් හරහා ගැලපීම සිදු කරත් ලාභයට වන බලපෑම වැලැක්විය නොහැක. | වර්ෂයට අදාළ වියදම් නිවැරදිව ගිණුම්ගත කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා ඛනිජ තෙල් සංස්ථාවෙන් 2022 වර්ෂයේ මාර්තු සිට දෙසැම්බර් දක්වා කාලයට අදාළව අයකරන ලද ඉඩ උපයෝජනය නොකළ දඩ මුදල රු.1,334,429ක් වූ අතර එම මුදලින් සමාලෝචිත වර්ෂයේ සමාගමට අයකර ගෙන තිබුණු සියයට 55කට සමාන වූ රු.733,936ක මුදල ආදායමට ගෙන ඇති බැවින් සමාලෝචිත වර්ෂයේ ආදායම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | 2022 වසරේ දී එම ආදායම අපගේ ආයතනයේ ආදායමට ගණනය නොවුනේ එම දඩ මුදල අදාල ඉන්වොයිසිය 2023 වසරේදී ශ්‍රී ලංකා ඛනිජ තෙල් සංස්ථා සඳහා නිකුත් කල බැවිනි. එම ඉන්වොයිසිය 2023 ජනවාරි මස නිකුත් කිරීම නිසා එම ආදායම 2023 වසරේ ආදායමට ගණනය වී ඇත. අපගේ මුළු ආදායම වන රු.මිලියන 612 ක අගය හා සංසන්දනය කිරීමේදී මෙහි බලපෑම 0.1 % කට ත් වඩා අඩුය. | වර්ෂයට අදාළ ආදායම නිවැරදිව හඳුනාගෙන නිවැරදිව ඉදිරිපත් කළ යුතු බව. |

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1954 අගෝස්තු 9 දිනැති අංක 19 දරණ සාප්පු හා කාර්යාල සේවක පනතේ I කොටසේ 3 වන වගන්තිය | යම් ආයතනයක් සේවකයන් වැඩමුර ක්‍රමයට සේවයේ යොදවයි නම් දිනකට උපරිම පැය 8 කට හා සතියකට පැය 45 කට සීමා විය යුතු වුවත් ඊට අනුකූල නොවන ලෙස සමාගම විසින් 2023 වර්ෂයේදී මෙහෙයුම් කාර්ය මණ්ඩලයේ සේවකයින් 40 දෙනෙකු පැය 24 ක වැඩමුර සඳහා සේවයේ යොදවා තිබුණු අතර සේවය ලබාගෙන තිබුණේ සතියකට දින 02ක් පමණි. | සමාගමේ සේවා අවශ්‍යතාව අනුව පැය 24 සේවා මුරය මෙහෙයුම් කටයුතු කාර්යක්ෂම හා බාධාවකින් තොරව සිදු කිරීම සඳහා හඳුන්වා දී ඇත. එකී පැය 24 සේවා මුර ක්‍රමය අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා 2021.02.25 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී ඇත. | සේවකයන්ගේ වැඩ කළ යුතු කාලය පනතේ දක්වා ඇති අයුරින් ක්‍රියාත්මක කළ යුතු බව. |
| (ආ) | 2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 56 වගන්තිය | සමාගම විසින් 2022 වර්ෂයේ ලාභයෙන් රු.25,000,000 ක් ලාභාංශ ලෙස ගෙවා තිබුණු අතර එම ලාභාංශය ගෙවූ පසු අධ්‍යක්ෂවරයන් විසින් ණය ගෙවීමේ හැකියාව පිළිබඳ පරික්ෂණය ඉටු කරන බව සඳහන් කරමින් සහතිකයක් හෝ ඒ පිළිබඳ විගණකවරුන්ගෙන් සහතිකයක් ලබාගැනීමට හෝ කටයුතු කර නොතිබුණි. | ණය ගෙවීමේ හැකියාව පිළිබඳ සහතිකයක් ඉදිරි වසර වලදී අවශ්‍ය අවස්ථාවලදී වලදී ලබා ගැනීමට කටයුතු කරනු ඇත. ඔබ විසින් පෙන්වා දී ඇති පරිදි වර්ෂයට අදාලව ගෙවන ලද ලාභාංශ ප්‍රමාණය වන රු.මි.25 මුදල ඉදිරියට ගෙනෙන ලද ලාභයට (Retained Earnings) ගිණුමෙන් ගලපා ඇත. | 2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 56 වගන්තිය ප්‍රකාරව ණය ගෙවීමේ හැකියාව පිළිබඳ සහතිකයක් විගණකවරුන්ගෙන් ලබාගැනීමට කටයුතු කළ යුතු බව. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2018 ඔක්තෝබර් 23 දිනැති හා අංක 05/2018, 2018 නොවැම්බර් 16 දිනැති අංක 05 දරන රාජ්‍ය මුල්‍ය චක්‍රලේඛය සහ 2019 දෙසැම්බර් 17 දිනැති හා අංක 08/2019 දරන මුදල් ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශ චක්‍රලේඛය | ශ්‍රී ලංකාව තුල ඉලෙක්ට්‍රෝනික රාජ්‍ය ප්‍රසම්පාදන (e-GP) පද්ධතිය ක්‍රියාත්මක කිරිම සම්බන්ධයෙන් ප්‍රසම්පාදන ආයතනය ලියාපදිංචි කිරිම, සම්බන්ධතා නිලධාරින් ලියාපදිංචි කිරිම, වාර්ෂික ප්‍රසම්පාදන සැලස්ම ප්‍රකාශයට පත්කිරිම, ප්‍රසම්පාදන දැන්වීම් පලකිරිම, Shopping ක්‍රමය e-GP පද්ධතිය භාවිතා කිරිම යනාදිය සම්බන්ධයෙන් චක්‍රලේඛ ප්‍රකාරව සිදුකර නොතිබුණි. | ඉලෙක්ට්‍රොනික රාජ්‍ය ප්‍රසම්පාදන (e – GP) පද්ධතිය ක්‍රියාත්මක කිරීම නිසි පරිදි අධ්‍යයනයකින් පසුව ක්‍රමයෙන් අප ආයතනය වෙත හඳුන්වාදීමට පියවර ගනු ඇත. | අදාළ චක්‍රලේඛවල දක්වා ඇති පරිදි ප්‍රසම්පාදන සම්බන්ධයෙන් හඳුන්වා දී ඇති නව පද්ධතියන්ට අනුගතව කටයුතු කළ යුතු බව. |
| (ඈ) | භාණ්ඩාගාර ලේකම්ගේ 2022 ජනවාරි 14 දිනැති 01/2015 (ii) අංක දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | සංස්ථා, මණ්ඩල හා රජය සතු සමාගම්වල ප්‍රවාහන පහසුකම් ලබාගත හැකි නිලධාරී කාණ්ඩ 03ක් සඳහා පවරා දී ඇති වාහන වෙනුවෙන් මාසිකව ලබාගතහැකි ඉන්ධන සීමාව ඉක්මවා එම නිලධාරී කාණ්ඩ 03 අතර ලීටර් 90ක් ලීටර් 85ක් හා ලීටර් 40 වශයෙන් චක්‍රලේඛයට පටහැනිව ඉන්ධන ලබාදී තිබූ අතර එම වැඩිවීම සියයට 62, සියයට 59 හා සියයට 30ක් වූයෙන් 2023 ජූනි සිට දෙසැම්බර් දක්වා වූ මාස 07 සඳහා රු.621,581ක් (ලීටර් 1670ක්) වැඩිපුර ගෙවා තිබුණි. | ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අනුබද්ධ ආයතනයක් ලෙස ක්‍රියාත්මක කරනු ලබන ජය කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ් ආයතනය කලින් කලට ගන්නා ලද අධ්‍යක්ෂ මණ්ඩල තීරණ අවශ්‍ය අවස්ථා වලදී රේඛීය අමාත්‍යාංශය හරහා මුදල් අමාත්‍යාංශයෙහි අනුමැතියට ඉදිරිපත් කරන ලදී. මෙම කාර්යය විධිමත් ලෙස සිදු කිරීම සඳහා 2022.01.31, 2022.03.14, 2022.05.09 දිනයන්වලදී මුදල් අමාත්‍යාංශය මඟින් JCT ආයතනය වෙත මින් ඉදිරියට ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අනුබද්ධ ආයතනයක් ලෙස නිසි අනුමැතීන් මවු ආයතනය වන ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙතින් ලබා ගන්නා ලිඛිත අනුමැතියක් මත අනුමත කරවා ගන්නා ලෙස ලිඛිතව දැනුම් දී ඇත.<br><br>එම උපදෙස් අනුව කටයුතු කරමින් මෙම ඉන්ධන සීමාවන් ඉහළ නැංවීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගෙන ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අනුමැතිය සඳහා ඉදිරිපත් කොට ලිඛිතව අනුමත කර ගනිමින් නිසි ක්‍රමවේදය අනුගමනය කළ බව සඳහන් කරමි.<br><br>මෙසේ කිරීමට හේතු වශයෙන් රටේ | චක්‍රලේඛයෙහි දක්වා ඇති ඉන්ධන සීමාව ඉක්මවා කටයුතු නොකළ යුතු බව. |

| | | | | |
|---|---|---|---|---|
| | | | පැවති බරපතල ඉන්ධන අර්බුදයට සෘජු ලෙස දායක වන ආයතනයක් වන JCT ආයතනය විධිමත් ලෙස පවත්වාගෙන යාම සඳහා නිළධාරීන් නිති පතා සේවයට වාර්තා කල යුතු අතර JCT ආයතනයේ දෛනික කටයුතු ක්‍රමවත්ව සහ විධිමත්ව පවත්වාගෙන යාමේ අරමුණින් නිලධාරීන්ගේ ඉන්ධන අවශ්‍යතාවය සැලකිල්ලට ගෙන ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සමගාමී නිලයන් සඳහා නිකුත් කරනු ලබන ඉන්ධන දීමනාවන් ද සැලකිල්ලට ගෙන නිසි ක්‍රමවේදය අනුගමනය කරමින් අප ආයතනයේ සමගාමී සමාන්තර ශ්‍රේණි වල නිලධාරීන් වෙත මෙම ඉන්ධන වැඩි කිරීම ලබා දීමට අනුමැතිය ලබා දී ඇත. තවද මෙම නිලධාරීන් සඳහා නිල නිවාස පහසුකම් සපයා නොමැති අතර එසේ තිබියදීත් සේවය ඉන්ධන හා ආර්ථික අර්බුධයත් විටින් විට ඇති වූ කාල සීමාවන් ද සැලකිල්ලට ගෙන සේවය අඛණ්ඩව පවත්වාගෙන යාමේ සහ ලාභදායීත්වය වැඩි කර ගැනීමේ කාරණා ද සැලකිල්ලට ගෙන මෙම තීරණයට එළඹී ඇත. | |
| (ඉ) | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු වේ 2023 මාර්තු 14 දිනැති අංක 02/2023 දරන චක්‍රලේඛය | 2023 වර්ෂය සඳහා අනුමත කරගෙන ඇති අයවැය ලේඛනය මගින් වෙන්කර ඇති පුනරාවර්තන වියදම් සියයට 6කින් කපාහරින ලෙස දක්වා ඇතත් ඒ කටයුතු කර නොතිබුණි. | අප ආයතනය විසින් 2023 මාර්තු 14 දිනැති අංක 02/2023 දරණ චක්‍රලේඛයට සහ Public Enterprise Circular 2022/04 දරණ චක්‍රලේඛයට අනුව අප ආයතනයේ වියදම් අවම කර ගැනීම සඳහා යෝජනා ඉදිරිපත් කිරීමට කමිටුවක් කළමනාකාර අධ්‍යක්ෂතුමාගේ ප්‍රධානත්වයෙන් සහ අංශ ප්‍රධානීන්ගේ සහභාගිත්වයෙන් පැවැත්වීමට යෝජනා කර වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යංශයේ ලේකම්වරයා වෙතද එම යෝජනා දන්වා යවන ලදී. මෙම චක්‍රලේඛවලට අනුව 2022 සහ 2023 වසර වල රැස්වීම් වාර කිහිපයක් පැවැත්විණි. එම රැස්වීම් වල සාකච්ඡා වුනු වියදම් අඩු කිරීමේ යෝජනා සහිත රැස්වීම් වාර්තා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සඳහාද | භාණ්ඩාගාරයෙන් වියදම් සීමා සඳහා නිකුත් කර ඇති චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |

යොමු කර ඇත. එබැවින් ඉහත චක්‍රලේඛ පිළිබඳව අපගේ ආයතනයේ අවධානය නිසි පරිදි යොමු කොට ඒ අනුව ගත යුතු ක්‍රියාමාර්ග නිසි පරිදි ගෙන ඇති බව දන්වා සිටිමි.

### 1.7 බදු රෙගුලාසිවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දේශිය ආදායම් කොමසාරිස් ජනරාල්ගේ 2023 ඔක්තෝබර් 24 දිනැති හා අංක FPFS/CONF/2023/25 දරන ලිපිය අනුව සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනතේ පලමු උපලේඛණයේ ii වන කොටසේ අයිතම 04 යටතේ තෙල් පොම්ප කිරීමේ ගාස්තු බදු නිදහස් සේවාවක් ලෙස සැලකිය නොහැකි බව දක්වා තිබුණද 2022 ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වා සහ 2023 ජනවාරි සිට දෙසැම්බර් දක්වා පිළිවෙලින් රු.115,462,139ක් හා රු.420,136,784ක් වූ තෙල් පොම්ප කිරීමේ ගාස්තුව මත අයකල යුතු සමාජ ආරක්ෂණ බද්ද රු.2,960,568ක් හා රු.10,772,738ක් අයකරගෙන දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කිරීමට කටයුතු කර නොතිබුණි. | සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද 2022 ඔක්තෝබර් මස හඳුන්වා දීමත් සමගම අපගේ ආයතනයේ ආදායම් අයිතම සඳහා එහි අදාලත්වය පිළිබඳ අපගේ බදු උපදේශන සමාගම වන අමරසේකර සහ සමාගම වෙතින් උපදෙස් ලබා ගන්නා ලදී. එම උපදෙස් වලට අනුව තෙල් පොම්ප කිරීමේ සේවාව (Pumping Charge) මෙම බද්දෙන් නිදහස් වන බව දන්වන ලදී.<br><br>මෙම තත්වය පිළිබඳව ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙතද ලිපියක් යොමු කොට දන්වා සිටි අතර 2024 මාර්තු 28 දිනැති ලිපිය මඟින් ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් දන්වා සිටියේ දේශීය ආදායම් දෙපාර්තුමේන්තුවෙහි නිළධාරින් හමුවී මෙම තත්වය පිළිබඳ ව වැඩි දුරටත් සාකච්ඡා කොට තීරණයක් ගන්නා ලෙසටය. ඒ අනුව අමරසේකර සහ සමාගම විසින් මේ පිළිබඳව 2024.04.04 දින ශ්‍රී ලංකා වරාය අධිකාරියේ නිලධාරීන් සහ දේශීය ආදායම් දෙපාර්තුමේන්තුවේ නිළධාරින් හමුවී සාකච්ඡාවක් පවත්වා ඇත. එහිදී පොම්ප කිරීමේ සේවාව Transportation of Goods ගණයට වැටෙන බව පැවසූ බව අමරසේකර සහ සමාගම දන්වා තිබුණි. කෙසේ වුවද, මේ පිළිබඳව ඉදිරියේදී තවත් සාකච්ඡාවක් පවත්වනු ලැබේ. | රජය විසින් හඳුන්වාදෙන බදු පනත් අනුව අදාළ බදු එකතුකර රජයට ප්‍රේෂණය කළ යුතු බව. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. මිලියන 243.8 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. මිලියන 245.6 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි සියයට 1 ක අඩු වීමක් නිරීක්ෂණය විය.

## 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

i. වාහන සඳහා ඉන්ධන වියදම පසුගිය වර්ෂයට සාපේක්ෂව රු.මිලියන 4.7 සිට රු.මිලියන 7.1 දක්වා රු.මිලියන 2.4 කින් වැඩිවී තිබුණි. මෙය සියයට 50 ක වැඩි වීමකි. මේ සඳහා නිලධාරීන්ගේ වාහන සඳහා දෙනු ලබන ඉන්ධන සීමාව වැඩි කිරීමද බලපා ඇත.

ii. කාර්යාල වාහන නඩත්තු වියදම් පසුගිය වර්ෂයට සාපක්ෂව රු. මිලියන 6.1 සිට රු.මිලියන 10.2 දක්වා රු.මිලියන 4.1 කින් වැඩි වී තිබුණි. මෙය සියයට 68 ක වැඩි වීමකි. මෙයින් දළ වශයෙන් රු.මිලියන 3 ක් හා රු.මිලියන 1.8 ක් පිළිවෙලින් සභාපතිවරයාගේ නිල රථය හා අමාත්‍යාංශයෙන් පවරා දී තිබුණු කාර් රථය නඩත්තුව වෙනුවෙනුවෙන් දරා ඇත.

## 2.3 අනුපාත විශ්ලේෂණය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

i. 2018 වර්ෂයේ ජංගම අනුපාතය සහ ක්ෂණික වත්කම් අනුපාතය පිළිවෙලින් 19.04:1 ක් හා 18.93:1 ක් වූ අතර සමාලොචිත වර්ෂය අවසාන වන විට එය පිළිවෙලින් 5.16:1 ක් හා 5.09:1 ක් දක්වා ක්‍රමයෙන් අඩුවී තිබුණි. පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලොචිත වර්ෂයෙදී ජංගම අනුපාතය සහ ක්ෂණික වත්කම් අනුපාතය පිළිවෙලින් 1.08 හා 1.04 කින් වර්ධනය වී ඇති බව නිරික්ෂණය වේ.

# 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මෙට්‍රික් ටොන් 1000 ක ධාරිතාවයෙන් යුතු අංක 102 දරණ තෙල් ටැංකියෙහි 2023 දෙසැම්බර් 31 දිනට 380 (HSFO) මෙට්‍රික් ටොන් 275ක් ගබඩා කර තිබුණි. එය සකස් වී ඇත්තේ සමාගම් දෙකකට අයත් මෙට්‍රික් ටොන් 40.26 ක්ද, ශ්‍රී ලංකා වරාය අධිකාරියට අයත් මෙට්‍රික් ටොන් 72 ක් ද ශ්‍රී ලංකා රේගුව විසින් රාජසන්තක කර ඇති තෙල් මෙට්‍රික් ටොන් 162.257කින් වේ. නීතිමය කටයුත්තක් සඳහා රේගුව විසින් මෙම තෙල් ටැංකිය මුද්‍රා තබා ඇති බැවින් 2020 වර්ෂයේ සිට මෙහෙයුම් කටයුතු සඳහා භාවිතයට ගත නොහැකිව නිෂ්කාර්යව පැවතුණි. | මෙම ටැංකියේ පවතින තෙල් ශ්‍රී ලංකා රේගුව විසින් රාජසන්තක කර ඇති බැවින් සහ ඒ පිළිබඳව නඩු කටයුත්තක් පවතින බැවින් මේ පිළිබඳව අප ආයතනය කීප වතාවක්ම මෙම තෙල් ඉවත් කර ගන්නා ලෙස ශ්‍රී ලංකා රේගුව වෙත දන්වා යවන ලදී. එමෙන්ම වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් පැවති රැස්වීම් වාර කිපයකදී ද රේගු නිලධාරීන් මේ පිළිබඳව දැනුවත් කොට ඉතා ඉක්මනින් මෙම තෙල් ඉවත් කර ගන්නා ලෙස දන්වා ඇත. | අදාළ පාර්ශවයන් සමග සාකච්ඡාකර තෙල් ටැංකි ඉඩකඩ කළමනාකරණය කර ගැනීමට කටයුතු කළ යුතු බව. |

## 3.2 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මානව සම්පත් ක්‍රියාකාරකම් හා වැටුප් ලේඛන සම්බන්ධ කටයුතු අතින් (manual) සිදුවීම හේතුවෙන් කාර්යක්ෂමව හා ඵලදායීව කාර්යය ඉටුකිරීමට ක්‍රමෝපායක් අවශ්‍ය බැවින් 2021 වර්ෂයේ සිට රු.976,000ක් වැයකර ලබාගත් HR & Payroll පද්ධතිය මේ වන තෙක් ක්‍රියාත්මක කර ගත නොහැකි තත්ත්වයක පැවතීම හා HR & Payroll පද්ධතිය මගින් ලබාගත යුතු අවසාන ප්‍රතිඵලය වන වැටුප් පත්‍රිකා නිවැරදිව මුද්‍රණය කරවා ගැනිමට මේ වනතෙක් අපොහොසත්ව තිබුණු බැවින් දරන ලද වියදමට උපරිම ප්‍රතිලාභයක් ලබාගැනීමට නොහැකිව තිබුණි. | සේවා මුර ක්‍රමය යටතේ සේවය කරනු ලබන සේවකයින් පැය 24 ක මුරය සඳහා (පෙ.ව 08.00- පසු දින පෙ.ව 08.00/ පෙ.ව 08.30- පසු දින පෙ.ව 08.30) කැදවීම හේතුවෙන් දින 03 ක් සඳහා සේවය කරන කාලසීමාවන් පරිගණක මෘදුකාංග පද්ධතියට වෙන වෙනම ස්වංක්‍රියව හඳුනාගත නොහැකි වීමේ දෝෂය පිළිබඳව මෙම මෘදුකාංගය සකස් කරන Antler IT solutions සමාගම විසින් අවශ්‍ය වැඩිදියුණු කිරීම් සිදු කිරීමට කටයුතු කරනු ඇත. එම සමාගමේ ප්‍රධාන විධායක නිලධාරි සමග පැවැති 2024/04/19 දිනැති රැස්වීමේදී මෙම දෝෂය නිවැරදි කිරීමට කඩිනමින් කටයුතු කරන බවට එකග වූ අතර දැනට වාර්තා වන සෙසු දෝෂ පිළිබඳව ද අවශ්‍ය වැඩිදියුණු කිරීම් සිදු කිරීමට එම සමාගම විසින් පියවර ගැනීමට එකග වී ඇත. මෙම ව්‍යාපෘතිය ඇගයීමෙන් පසුව සිදු කරනු ලැබූ අතිකාල ලබා ගැනීමේ සහ නම්‍යශීලී කාර්යාල වේලාවන් හඳුන්වා දීම වැනි වෙනස්කම් හේතුවෙන් ද දැනට සකස්කර ඇති මෘදුකාංගය වෙනස් කිරීමට සිදුව ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානයන්ට අනුකූල විය යුතු බව. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය සමග නිකුත් කර ඇති රාජ්‍ය ව්‍යාපාර සඳහා වූ මෙහෙයුම් අත්පොත (Operational Manual) 3.2 (ii) සමාගම සඳහා විධිමත් බඳවා ගැනීමේ පරිපාටියක් සකස්කර ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ හා රේඛීය අමාත්‍යාංශයේ අනුමැතිය සහ පොදු ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ එකඟතාව ලබාගෙන නොතිබුණු අතර එහි 3.3(ii) වගන්තිය අනුව සෑම රාජ්‍ය ව්‍යාපාරයක් විසින්ම අනුමත සේවක සංඛ්‍යාව සමග සංවිධාන සටහන සකස් කර තිබිය යුතු වුවත්, සමාගම එම අවශ්‍යතාවය ඉටුකර නොතිබුණි. | ජය කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ් සමාගමේ අනුමත සේවක සංඛ්‍යාව සමඟ සංවිධාන සටහන සහ බඳවාගැනීමේ පටිපාටිය පිළිබඳ කෙටුම්පත් මානව සම්පත් කමිටුව වෙත මේ වන විටත් ඉදිරිපත් කර ඇති අතර ඉදිරියේදී අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව ඉදිරි පියවර ගැනීමට කටයුතු කරනු ඇත. | රජය විසින් හඳුන්වා දී ඇති චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතු බව. |